# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 2171635 — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 2034 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 27/07/2024 පැය 0705

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයකට අවශකර සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.07.23 වන දින අළුයම් කාලයේ කුරුඳුවත්ත පොලිස් වසමේ වෝඩ් පෙදෙසේදී ත්‍රීරෝද රථයක් තුල තියුණු ආයුධයකින් පහර දී පුද්ලයෙකු ඝාතනය කරීම සම්බන්ධව කුරුඳුවත්ත පොලිසිය සහ කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

ඒ අනුව 2024.07.26 වන දින ග්‍රැන්ඩ්පාස් පොලිස් වසමේ සමගි මාවත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මෙම අපරාධයට අවශකර සිටි සැකකරුවන් දෙදෙනෙකු ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටියදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 35 හා 48 වයස්වල පසුවන ගෝනවිල හා ග්‍රැන්ඩ්පාස් යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම එක් සැකකරුවෙකු සන්තකයේ තිබී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 30 මිලිග්‍රෑම් 200 ක් සොයා ගෙන ඇත. ඝාතනයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. කොළඹ අපරාධ කොට්ඨාශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - නිට්ටඹුව පොලිස් වසම.

2024.07.27 වන දින අළුයම් කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ නිට්ටඹුව තිහාරිය ප්‍රදේශයේදී නුවර දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ ජීප් රථයක් මාර්ගය අයිනේ ගමන් කරමින් සිටි පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ කලටුවාව, කළගෙඩිහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ජීප් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**